00113

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණ වැඩ සටහන
අවසාන පරීක්ෂණය 2009
ගිණුම්කරණය හා මූල්‍යයට හැඳින්වීමක් - MCC 1206
කාලය පැය දෙකයි (02)

---

**දිනය : 2009.12.12** **වේලාව : ප. ව. 1.30 – ප. ව. 3.30**

---

පළමු පශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
වැඩ සටහන් ගත නොකල ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ලැබේ.

1. “ කුමාර් ට්‍රේඩර්ස් ” ව්‍යාපාරයේ 2008 දෙසැම්බර් 31 ත් අවසන් වර්ෂයට පිළියෙල කරන ලද ශේෂ පිරික්ෂුම පහත දැක්වේ.

| ශේෂයන් | හර (රු) | බැර (රු) |
|---|---|---|
| මුදල් හා බැංකු | 41,000 | |
| රක්ෂණ | 18,000 | |
| විදුලිය | 21,000 | |
| බැංකු ගාස්තු | 4,000 | |
| ඉඩම් සහ ගොඩනැගිලි / 2008.01.01 දිනට සමුච්චිත ක්ෂය | 750,000 | 250,000 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් / 2008.01.01 දිනට සමුච්චිත ක්ෂය | 500,000 | 200,000 |
| බොල්ණය | 4,200 | |
| ලැබූ කොමිස් | | 24,000 |
| ආපසු එවූම් | 9,000 | |
| ආපසු යැවුම් | | 6,800 |
| ණයගැතියෝ | 52,000 | |
| 2008.01.01 දිනට තොගය | 31,000 | |
| ණයහිමියෝ | | 43,000 |
| 12% බැංකු ණය | | 250,000 |
| ගෙවූ බැංකු ණය පොලී | 13,000 | |
| දුන් වට්ටම් | 4,000 | |
| ලද වට්ටම් | | 8,000 |
| වැටුප් | 31,000 | |
| ප්‍රචාරණය | 18,000 | |
| වරිපනම් | 14,000 | |
| ගැණුම් | 910,000 | |
| විකුණුම් | | 1730,000 |
| කුමාර්ගේ ගැනීලි | 27,000 | |
| දුරකථන | 15,000 | |
| ඇසුරුම් වියදම් | 7,000 | |
| 8% ආයෝජන | 400,000 | |
| ලැබූ ආයෝජන ආදායම් | | 13,000 |
| ගෙන එමේ කුලී | 5,600 | |
| කුමාර් යෙදූ ප්‍රාග්ධනය | | 350,000 |
| | 2,874,800 | 2,874,800 |

පහත දැක්වෙන විස්තර සැලකිල්ලට ගන්න.

- 2008/12/31 දිනට අවසාන තොගය රු.23,000/- ක් ලෙස අගය කර ඇත.
- ශේෂ පිරික්සුමේ දක්වා ඇති වැටුප් වලට කුමාරගේ නිවසේ සේවකයකුට ගෙවූ රු.3,000/- ඇතුලත්ය.
- 2008 දෙසැම්බර්මාසය සඳහා ගෙවිය යුතු විදුලි බිල්පත ව්‍යාපාරයට ලැබී තිබුනේ 2009 ජනවාරි මාසයේදීය.
- රක්ෂණ සහ ප්‍රචාරන ගෙවීම් පිළිවෙලින් රු.2,000/- ක් හා රු. 3,000/- ක් ඉදිරි වර්ෂයට ගෙන යා හැකිය.
- ගොඩනැගිලි 5% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
- ලීබඩු හා සවිකිරීම් 10% බැගින් හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කළ යුතුය.
- ශේෂ පිරික්සුමේ පෙන්නුම් කෙරෙන ආයෝජන සහ බැංකු ණය ශේෂයන් වර්ෂය මුල සිට ව්‍යාපාර ලෙජරයේ දක්වා තිබුණි. වර්ෂය අග වන විට බැංකු ණය පොලී ගෙවිය යුතුව ඇති අතර ආයෝජන ආදායම් ලැබිය යුතුව ඇත.
- ශේෂ පිරික්සුමේ පෙන්නුම් කෙරෙන මුළු ණයගැතියන්ගෙන් රු.3,000/-ක් බොල්ණය ලෙස ලියා හැරිය යුතු අතර ඉතිරි ණය ගැතියන්ගෙන් 5% ක් අඩමාන ණය ලෙස වෙන් කළ යුතුය.

ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය.

- කුමාර් ට්‍රේඩර්ස් හි 2008/12/31 න් අවසන් වර්ෂයේ වෙළඳ හා ලාභා ලාභ ගිණුම
- 2008/12/31 දිනට ශේෂ පත්‍රය. ( ලකුණු 40 )

2. අමල් දේශීය වෙළඳපලට කේක් නිෂ්පාදනය කරන ව්‍යවසායකයෙකි. මෙම නිෂ්පාදන ව්‍යාපාරයේ 2008 වර්ෂයට අදාළ සහත දැක්වෙන තොරතුරු ඔබට සපයා ඇත.

මිලදී ගත් අමුද්‍රව්‍ය රු.167,000/-
අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී රු.4,500/-
ගෙවූ බදු සහ කුලී රු.12,000/- (මුළු බිම් ප්‍රමාණයෙන් 60% ක කර්මාන්ත ශාලාව පිහිටා ඇත.)
වෙනත් වක්‍ර අමුද්‍රව්‍ය රු.15,000/-
බලය සහ විදුලිය රු.28,000/- (කාර්යාල පරිපාලනයට 20% අදාළ වේ.)
සෘජු වැටුප් රු.78,000/-
දුරකථන රු.7,000/- (පරිපාලන සහ විකුණුම් අංශයට 80% අදාළ වේ.)
සුපරීක්ෂක වැටුප් රු.20,000/-
2008/01/01 දිනට නොනිමි වැඩ රු.21,000/-
2008/12/31 දිනට නොනිමි වැඩ රු.11,000/-
ස්ථාවර වත්කම් ක්ෂය රු. 27,000/-(මුළු ක්ෂය ප්‍රමාණයෙන් 2/3 ක් යන්ත්‍ර ක්ෂය වේ.)
2008/01/01 දිනට අමු ද්‍රව්‍ය තොගය රු.15,000/-
2008/12/31 දිනට අමු ද්‍රව්‍ය තොගය රු.12,000/-

ඔබ විසින් පහත සඳහන් දෑ පිළියෙල කළ යුතුය.

(අ) 2008/12/31 දිනෙන් අවසන් වර්ෂයට අමල්ගේ නිෂ්පාදන ගිණුම

(ආ) අමල් විසින් 2008 වර්ෂයේදී එකම ප්‍රමාණයේ කේක් පැකට් 20,000 ක් නිෂ්පාදනය කළේ නම් කේක් පැකට් එකක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(ඇ) නිෂ්පාදන පිරිවැයට 25% ලාභ ආන්තිකයක් එකතු කර විකුණුම් මිල තීරණය කරන්නේ නම් කේක් පැකට් එකක විකුණුම් මිල සොයන්න.

( ලකුණු 20 )

3. විජේ විසින් 2009 මාර්තු 01 දින සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. ඔහුගේ සිල්ලර වෙළඳ ව්‍යාපාරයේ පළමු මාසය තුල සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | |
|---|---|
| 2009/03/01 | විජේ විසින් රු.300,000/- මුදලින් ආයෝජනය කර ව්‍යාපාරය ආරම්භ කලා. |
| 2009/03/04 | රු.45,000/- ක් වටිනා බඩු මිල දී ගත්තා. |
| 2009/03/06 | මුදලට විකුණුම් රු. 52,000/- |
| 2009/03/11 | රු.40,000/- ක් වටිනා භාණ්ඩ ප්‍රනාන්දුගෙන් ණයට ගත්තා. |
| 2009/03/14 | මොහාන්ට ණයට විකුණුම් රු. 52,000/- |
| 2009/03/17 | ගෙවූ විදුලි හා දුරකථන බිල්පත් පිළිවෙලින් රු.4,200/- සහ රු.3,500/- විය. |
| 2009/03/19 | ප්‍රනාන්දුට ගෙවූ මුදල් රු.30,000/- |
| 2009/03/21 | වෙනත් ආයතනයකට ප්‍රවාහන සේවා සැපයීමෙන් ලැබූ කොමිස් ආදායම රු. 8,000/- විය. |
| 2009/03/21 | මොහාන් විසින් ඔහුගේ ණය මුදල සම්පූර්ණයෙන් පියවීමට මුදල් ගෙවන ලදි. |
| 2009/03/21 | එක් සේවකයකුට ගෙවූ වැටුප් රු. 5,500/- |
| 2009/03/27 | මහේන්ට විකුණුම් රු. 27,000/- |
| 2009/03/31 | විජේ විසින් රු.8,000/- ගැතිලි ලෙස ලබා ගත්තා ලදි. |

ඉහත ගණුදෙනු සඳහා පහත සඳහන් දෑ පිළියෙල කරන්න.

- මූලික පොත්
- උචිත ලෙජර්වල ද්විත්ව සටහන්
- ශේෂ පිරික්සුමේ ශේෂයන් පෙන්නුම් කරන්න.

( ලකුණු 20 )

4. (i) " මුදල් පොත ද්විත්ව කාර්යයක් ඉටු කරයි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ii) කුඩා පරිමාණ ව්‍යවසායකයකුට සුළු මුදල් පොතේ වැදගත්කම පැහැදිලි කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ ව්‍යවසායකයන්ට ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඇති විවිධ මූලාශ්‍ර පැහැදිලි කරන්න.

(iv) මුදල් අයවැය ලේඛනයේ නිරූපනය කරන අතිරික්ත මුදල් ප්‍රයෝජනයට ගැනීම සඳහා ව්‍යවසායකයකුට ඇති විවිධ ක්‍රම සාකච්ඡා කරන්න.

( ලකුණු 20 )

5. පහත දැක්වෙන ඕනෑම හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ගිණුම්කරණ සමීකරණය
(ii) කාරක ප්‍රාග්ධනය
(iii) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
(iv) කාර්ය පිරිවැයකරණය
(v) සමච්ඡේදන ලක්‍ෂ විශ්ලේෂණය
(vi) ගිණුම්කරණ අනුපාත

( ලකුණු 20 )

– හිමිකම් ඇවිරිණි –